# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1992 අගෝස්තු මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 07 වන දින]

එල්. ඩී.—ඕ. 40/92

## දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 35 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ එම බැංකුවේ නිලධරයකු විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 417 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ ඇති "මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කර නියම කරනු ලැබිය හැකි වේලාවක දී හෝ වේලාවල දී එහෙත් නිකුත් කිරීමේ දින සිට එක් වර්ෂයකට පසුව නොවන කාලයක දී සම මිලට මුදල් ගෙවනු ලැබිය හැකිය" යන වචන වෙනුවට "මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කර නියම කරනු ලැබිය හැකි වේලාවක දී හෝ වේලාවල දී සම මිලට මුදල් ගෙවනු ලැබිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල යග පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 255 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.